# ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
லலித் அத்துலத்முதலி மஹபொல உயர்கல்வி புலமைப்பரிசில் நம்பிக்கை நிதியம்
LALITH ATHULATHMUDALI MAHAPOLA HIGHER EDUCATION SCHOLARSHIP TRUST FUND

8 වන මහල, සතොස මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල, 27, වොක්ස්හෝල් වීදිය, කොළඹ 02, ශ්‍රී ලංකා.
8ஆம் மாடி ,சதொச செயலகக் கட்டிடம் இல 27,வொக்ஸ்ஹோல் வீதி,கொழும்பு 02.
8TH Floor, CWE Secretariat Building, No.27, Vauxhall Street, Colombo 02, Sri Lanka


මගේ අංකය
எனது இல. MTF/1/4/NEW.SCH
My No.

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி 2026.02 25
Date

## මාධ්‍ය නිවේදනය

**<u>ඩිට්වා සුළිකුණාටුව (Cyclone Ditwah) හේතුවෙන් බලපෑමට ලක් වූ සිසුන් සඳහා විශේෂ එක්වරක මහපොළ ශිෂ්‍යත්ව වැඩසටහනක්</u>**

2025 නොවැම්බර් 28 සිට දෙසැම්බර් 03 දක්වා පැවති ඩිට්වා සුළිකුණාටුව (Cyclone Ditwah) හේතුවෙන් බලපෑමට ලක් වූ සිසුන්ට ආර්ථික සහන සැපයීම සඳහා, ලලිත් අතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර අරමුදලේ (MTF) භාරකාර මණ්ඩලය විසින් විශේෂ එක්වරක ශිෂ්‍යත්ව වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී ඇත.

මෙම විශේෂ ශිෂ්‍යත්ව වැඩසටහන, ඩිට්වා සුළිකුණාටුව හේතුවෙන් මව්පියන් එක් අයෙකු හෝ දෙදෙනාම අහිමිවී, පවුලේ ආර්ථික සහාය අහිමි වූ රාජ්‍ය විශ්වවිද්‍යාල, උසස් තාක්ෂණික ආයතන සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) අධීක්ෂණයට ලක් වන අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවල ලියාපදිංචි සුදුසුකම් ඇති සිසුන් සඳහා අදාළ වේ.

මෙම ශිෂ්‍යත්ව වැඩසටහන පහත කාණ්ඩ තුනක් යටතේ ක්‍රියාත්මක වේ:

- ඩිට්වා සුළිකුණාටුව හේතුවෙන් මව්පියන් අහිමි වූ දැනටමත් මහපොළ ශිෂ්‍යත්ව ලබන සිසුන්,
- ඩිට්වා සුළිකුණාටුව හේතුවෙන් මව්පියන් අහිමි වූ, දැනට මහපොළ ශිෂ්‍යත්ව නොලබන සිසුන්,
- මහපොළ ශිෂ්‍යත්ව නොලබන නමුත් අනෙකුත් ශිෂ්‍යත්ව හෝ බර්සරි ලබා ගනිමින් සිටින අතර, ඩිට්වා සුළිකුණාටුව හේතුවෙන් මව්පියන් අහිමි වූ සිසුන්.

අයදුම්පත් අදාළ විශ්වවිද්‍යාල මගින් භාරගනු ලබන අතර, ග්‍රාම නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම් විසින් සනාථ කරන ලද, ව්‍යසනය හේතුවෙන් මරණය සිදුවී ඇති බව සහ පවුලේ ආර්ථික සහය අහිමිවී ඇති බව තහවුරු කරන සහතික, එම විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විසින් සිසුන්ගේ ලියාපදිංචිය සහ පාඨමාලා අධ්‍යයනය තහවුරු කරන සහතික සමඟ ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් මහපොළ වෙබ් අඩවිය වන www.mahapola.lk වෙතින් බාගත කර ගත හැකි අතර, අදාළ විශ්වවිද්‍යාලවල ශිෂ්‍ය සුබසාධන අංශවලින්ද ලබා ගත හැක.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2026 මාර්තු 20 වේ.

මෙම විශේෂ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් අවසන් තීරණය ලලිත් අතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර අරමුදලේ භාරකාර මණ්ඩලය සතු වේ.

නිකුත් කරනු ලබන්නේ:

විජිත් කේ.මලල්ගොඩ
විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරන විනිසුරු,
සභාපති,
ලලිත් අතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරඅරමුදල




CamScanner